පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 7 අංක 1 | 2005 ජනවාරි-පෙබරවාරි

# වී වගාවේ නව ක්ෂේත්‍ර සංස්ථාපන ක්‍රමයක්

## "පැල වැපිරීම"

මෙය බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් වී වගාවට හඳුන්වා දෙන නවතම ක්ෂේත්‍ර සංස්ථාපන ක්‍රමයයි. මෙය "පැරෂුට් ක්‍රමය" ලෙස ද හඳුන්වයි.

ගොයම් පැල සිටුවීම වී ශාකයේ වර්ධනයට වාසි රැසක් ලබාදෙන නමුත් ඒ සඳහා වැඩි කම්කරු ශ්‍රමයක් වැය වේ. වැඩි කම්කරු කුලිය හා කම්කරු හිඟය නිසා අප රටේ ගොවීන්ගෙන් වැඩි දෙනෙක් වී වැපිරීමට යොමුවී ඇත.

මෙම අවාසි මඟහැරීම සඳහා බීජ වැපිරීමත්, පැල සිටුවීමත් යන ක්ෂේත්‍ර සංස්ථාපන ක්‍රම දෙකෙහිම වාසි ඒකරාශිවූ ක්‍රමයක් ලෙස මෙම නව ක්‍රමය හඳුන්වා දී ඇත. මෙහිදී කුඩා කුටි සහිත ප්ලාස්ටික් තැටියක, කුටි තුළට මඩ යොදා ඒ මත වී පැලකොට දින 12-15 කදී තැටියෙන් පස් කුට්ටියත් සමඟ ගලවාගත් ගොයම් පැල ක්ෂේත්‍රයට විසි කරනු ලැබේ. මෙහි විශේෂත්වය වන්නේ අඩු ශ්‍රමයකින් හා පහසුවෙන් වගාව ක්ෂේත්‍රයේ සංස්ථාපනය කළ හැකිවීමයි. මෙය පළමුවෙන්ම දෙමුහුම් වී වගාවේදී බීජ සඳහා යන වියදම අඩු කිරීමට අඩු බීජ ප්‍රමාණයක් භාවිතා කිරීම සඳහා හඳුන්වා දෙන ලද අතර පසුව මෙම ක්‍රමය නුමුහුම් වී ප්‍රභේද සඳහාද සාර්ථකව භාවිතා කළ හැකි බැව් පෙනී ගොස් ඇත.

### තවාන් තැටි

තවාන් තැටිය සෙ.මී. 59 ×සෙ.මී. 34 ×සෙ.මී. 2 ප්‍රමාණයේ ප්ලාස්ටික් තැටියකි (රූපය 1). එක් තැටියක කුඩා කුටි 425 ක් ඇත. අක්කරයක බීජ පැල වැපිරීම සඳහා තැටි 313 ක් අවශ්‍ය වන අතර තැටි තැබීම සඳහා වර්ග මීටර 100 ක පමණ භූමි ප්‍රමාණයක් අවශ්‍ය වේ. එක් තැටියක් කන්න කිහිපයක් භාවිතා කළ හැකිවේ.

### තවාන් දැමීම

තවාන් සැකසීම ආකාර දෙකකට කළ හැක.

### i. මඩ තවාන

වගා කරන කුඹුරේම කොටසක හොඳින් බිම් සකසා අඟල් 4 ක් උස අඩි 2 1/2 ක් පළල පාත්ති සකස් කරන්න. තවානේ දිග තමන්ට අවශ්‍ය පරිදි සකසාගත හැක. තවානේ මඩ දැඩිවීම



රූපය 1: තවාන් තැටියක්

සඳහා තවානේ තැටි තැබීමට පැය 5-6 කට පෙර පාත්ති සකසා ගත යුතුය. දැඩි වූ පාත්ති මත එකිනෙකට හොඳින් ගැටෙන සේ තැටි පේළි 2 ක් තබා පිදුරු තණකොළ කැබලි හා ගල්කැට වැනි අපද්‍රව්‍ය රහිත හොඳින් දිය වූ මඩ තැටියේ කුටි වලින් 3/4 ක් පමණ පිරෙන සේ දමා තැටිමත වැඩිපුර ඇති මඩ ඉවත් කිරීම සඳහා එක් පැත්තකට අතින් පිස දමන්න. තැටිවලට දැමීම සඳහා වැලිපස් සුදුසු නැත. සියුම් මැටි සහිත පස භාවිතා කළ යුතුය. ඉන්පසුව රෑ දෙකක් යහන් කළ වී (කණු කැපුන වී) තැටියේ එක් කුටියකට එකක්වත් වැටෙන සේ ප්‍රවේශමෙන් තැටි මත වපුරන්න. ඉන්පසුව තැටි දරවල ඇති වී ඇට හා මඩ ඉවත් කිරීම සඳහා, අත වතුරෙන් තෙමා එක් පැත්තකට පමණක් පිස දමන්න.

### ii. ගොඩ තවාන

හොඳින් ආලෝකය ලැබෙන, ජලය ලබාගත හැකි උස්බිමක, ගෙමිදුලක හෝ පිලක වුවද තවාන දැමිය හැක. මේ සඳහා ඉහතදී මෙන් පාත්ති දැමීම අනවශ්‍යය. තද පොළොව මත එක ලඟින් සිටින සේ තැටි පේළි 2 ක් අතුරා තැටිවල 3/4 පමණ පිරෙන සේ, අපද්‍රව්‍ය රහිත මැටි සහිත සියුම් වියලි පස් දමා ඉහතදී මෙන් බීජ වපුරන්න. ගොඩ තවාන සඳහා පැල නොකළ (කැකුළු වී) හෝ දින දෙකක් යහන්කොට කණු කැපුණු බීජ යොදගත හැක. ඉන්පසු බීජ වැසියන සේ තුනී පස් තට්ටුවක් දමා තැටිවල දරමතුවන සේ කොස්සකින් සෙමෙන් අතුගා හෝ පිස වැඩිපුර ඇති පස ඉවත් කරන්න. ඉන්පසුව හොඳින් තෙමෙන සේ තැටි මතට මල් බාල්දියකින් ජලය ඉසින්න.

## තවානට පොහොර යෙදීම

ගොඩ හා මඩ තවාන් සඳහා පස් යොදන විට අක්කරයක තවානක් සඳහා ට්‍රිපල් සුපර් පොස්පේට් ග්‍රෑම් 750 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් ග්‍රෑම් 250 ක් හා සින්ක් සල්ෆේට් ග්‍රෑම් 100 ක් හොඳින් පස් සමඟ මිශ්‍ර කරන්න. පැල වලට දින 7-8 ක් ගිය පසු, අක්කරයක තවානකට යූරියා ග්‍රෑම් 500 ක් ඉස පත්‍ර තෙමී යන සේ උදේ සවස දින 2 ක් ජලය ඉසින්න.

## බීජ අවශ්‍යතාවය

අක්කරයක තවානක් සඳහා තැටි 313 ක් අවශ්‍ය වන අතර මෙම තැටි ගණනේ ඇති කුටි ගණනට අවශ්‍ය බීජ ප්‍රමාණය ගණනය කොට තවානට ඉසිය යුතුය. එක් කුටියකට බීජ 2 ක් වැටේ නම් අක්කරයකට බීජ කි.ග්‍රෑ. 8 ක්ද, එක් කුටියකට බීජ 3 ක් වැටේ නම් අක්කරයකට බීජ කි.ග්‍රෑම් 12 ක් ද අවශ්‍ය වේ. දෙමුහුම් වී සඳහා එක් කුටියකට බීජ එකක් පමණක් දැමිය යුතු නිසා අක්කරයක් සඳහා බීජ කි.ග්‍රෑම් 4 ක් සෑහේ.

තවාන් දැමූ පසු වර්ෂාවෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වියන ලද පොල් අතුවලින් ආවරණය කරන්න. දින දෙකකට පසු ආවරණය ඉවත් කරන්න.

## ජලය සැපයීම

මඩ තවාන් නම් තැටිවල තෙතමන තත්වය බලා අවශ්‍ය නම් මල් බාල්දියකින් ජලය යොදන්න. තැටි යටවන සේ ජලය බැඳීමෙන් වලකින්න. ගොඩ තවානේ වී පැලවෙන තෙක් දිනකට වරක් ද, පැලවූ පසු දිනකට දෙවරක්ද මල් බාල්දියෙන් ජලය දමන්න.

## පැල වැපිරීම

දින 12-15 කදී ගොයම් පැල වැපිරීමට සුදුනම්ය (රූපය 2). මේ වන විට පැල අඟල් 4 පමණ උසට වැඩී ඇත. පැල වැපිරීම සඳහා කුඹුර හොඳින් පිළියෙල කොට මට්ටම් කොට ජලය කපා හැරිය යුතුය. ගොයම් පැල සහිත තැටි තනි තනිව අතින් ඔසවා ගෙන හෝ පැල ගලවා භාජනයක දමා එක් අහුරකට පැල 15-20 ක් පමණ සිටින සේ ගෙන කුඹුරට ඉසින්න. ලියදි කුඩා නම් ලියැද්දට නොබැස නියරේ සිටම පැල විසිකළ හැක.

සාර්ථක අස්වැන්නක් සඳහා වර්ග මීටරයකට පැල 30-35 ක් වැටෙන ලෙස වැපිරිය යුතුය. පඳුරු දැමීම වැඩි කිරීම සඳහා හැකි සෑම විටම ජලය අඩුවෙන් බඳින්න. ක්ෂෙත්‍රයේ සංස්ථාපනය කිරීමෙන් පසු සාමාන්‍ය ආකාරයට අනෙක් නිර්දේශිත වගා ක්‍රම අනුගමනය කරන්න.

## ශ්‍රම අවශ්‍යතාව

අක්කරයක් වගා කිරීමට, අවශ්‍ය පරිදි තවාන් දමා ගලවා පැල වැපිරීම සඳහා මිනිස් දින 6-8 ක් අවශ්‍යවන අතර සාමාන්‍ය පැල සිටුවීමේදී අක්කරයකට මිනිස් දින 12-14 ක් වැය වේ.

## පැල වැපිරීමේ ක්‍රමයේ වාසි

- තවාන් දැමීම, පැල ගැලවීම හා ක්ෂෙත්‍ර සංස්ථාපනය සඳහා යන කම්කරු අවශ්‍යතාවය, සාමාන්‍ය පැල සිටුවීමේ ක්‍රමයට වඩා 50% කින් පමණ අඩුකරගත හැක.
- දින 12-15 පමණ වයසැති ලපටි පැල පස මතුපිටට ඉසින නිසා පඳුරු දැමීම වැඩිවී පඳුරක සරු කරල් ගණන වැඩි වේ.



රූපය 2: වැපිරීමට සුදුසු තත්වයේ පැල

- ගොයම් පැල පස් කුට්ටියත් සමඟ ගැලවී එන නිසා සාමාන්‍ය පැල සිටුවීමේදී මෙන් මුල් නොකැඩේ. මේ නිසා ඉතා ඉක්මනින් පැල ක්ෂෙත්‍රයේ ස්ථාපිත වේ. නමුත් සාමාන්‍ය ක්‍රමයට සිටවූ පැළ ප්‍රකෘති තත්වයට පැමිණීමට දින 7ක පමණ කාලයක් *(transplant shock)* ගත වේ. එනිසා අතින් සිටුවනවාට වඩා පැල වැපිරීමේදී දින 7-8 කට කලින් අස්වනු නෙලා ගත හැක.
- තවාන කුඹුරෙන් බැහැරව පවත්වා ගැනීමට හැකි නිසා ජල අවශ්‍යතාවය අඩුවේ. එසේම පැල ඉසින විට තවාන සති 2 ක් පමණ වැඩි ඇති නිසා පැල ප්‍රකෘති තත්වයට පැමිණීමට කාලයක් ගත නොවන බැවින්, අතින් සිටුවනවාට වඩා ඉක්මනින් අස්වනු නෙලිය හැක. මේ නිසා ජලමුර 2 ක් පමණ ඉතිරි කර ගත හැකිය. මෙය මහා වාරිමාර්ග යටතේ කුඹුරු වගාවේදී ලබාගත හැකි විශාල වාසියකි.
- වැඩිපුර පඳුරු දමන නිසා අක්කරයකට බීජ කිලෝග්‍රෑම් 8-12 ක් සෑහෙන බැවින් අක්කරයකට බීජ කිලෝ 8-10 ක් පමණ ඉතිරි කරගත හැක (සාමාන්‍ය ක්‍රමයට අක්කරයක් වැපිරීමට බීජ කි.ග්‍රෑම් 40 ක් හා පැල සිටුවීමට බීජ කි.ග්‍රෑම් 20 ක් අවශ්‍ය වේ).
- සින්ක් වැනි අංශුමාත්‍ර මූලද්‍රව්‍ය හා කෘමිනාශක ආදිය තවානකට යෙදිය හැකි නිසා ඒවායේ කාර්යක්ෂමතාවය වැඩිවී යොදන ප්‍රමාණයද අඩු කර ගැනීම තුළින් මුදල් ද ඉතිරි කර ගත හැක. එසේම පරිසරයට වන හානියද අඩු වේ.
- සාමාන්‍යයෙන් බීජ වැපිරීමේදී හා සාමාන්‍ය මඩ තවාන් දැමීමේදී කුරුල්ලන්ගෙන් බීජ වලට වන හානි මෙම ක්‍රමයේ දී අවම වේ.
- නිරපරාදේ බීජ අපතේ යන අධි ඝනත්ව (අක්කරයකට බීජ කි.ග්‍රෑ. 80-120) බීජ ඉසීමේ ප්‍රවණතාවය බීජ පැල ඉසීම ප්‍රචලිත වනවාත් සමඟ අඩුවීමට ඇති ඉඩකඩ වැඩිවේ.

*මූලාශ්‍රය : එස්.එන්. ජයවර්ධන, පර්යේෂණ නිලධාරී, එස්.ඩබ්. අබේසේකර, පර්යේෂණ නිලධාරී, ආචාර්ය සුමිත් අබේසිරිවර්ධන (අධ්‍යක්ෂ) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, ඉබ්බාගමුව.*

# කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද නව ප්‍රභේද

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2004 ඔක්තෝබර් මස පැවැති ප්‍රභේද නිර්දේශ කිරීමේ කමිටුවේදී නව ප්‍රභේද 7 ක් වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

## At 306 - සුවඳ සහිත බාස්මතී ආකාර නව වී ප්‍රභේදයක්

වැඩි අස්වනු ලබාදෙන අර්ධකුරු පැළෑටි ස්වරූප සහිත වී ප්‍රභේද හඳුන්වාදීමත් සමග පාරම්පරිකව වගා වූ සිහින් දිගැටි සහල් සහිත වී ප්‍රභේද වගාකිරීම ක්‍රමයෙන් අඩුවිය. කෙසේ නමුත් සුවඳින් යුතු සිහින් දිගැටි සහල්වලට ස්ථාවර ඉල්ලුමක් පවතින අතර, එබැවින් බාස්මති ආකාරයේ සහල් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව ශ්‍රී ලංකාවට ආනයනය කෙරේ. මේ නිසා විදේශ විනිමය ඉතිරි කර ගැනීම උදෙසාත්, දේශීය පාරිභෝජනය සඳහා ඉහළ ගුණාත්මයෙන් යුතු සහල් සැපයීම සඳහාත් වැඩි අස්වනු දෙන සිහින් දිග සහල් සහිත ප්‍රභේදයන් සංවර්ධනය අවශ්‍ය වී ඇත.

බාස්මති යනු වඩාත් ඉහල ගුණාත්මයෙන් යුතුබවට ජාත්‍යන්තරව පිළිගත් ප්‍රභේදයන් වන අතර, අනෙක් සහල් ප්‍රභේද වලට වඩා ඉහළ වෙළෙඳපොල අගයයක් එයට හිමිවී තිබේ. මෙම සහල් ප්‍රධාන වශයෙන් ඉන්දියාව, පාකිස්ථානය සහ තායිලන්තය වැනි රටවල් විසින් නිපදවනු ලැබේ.

දේශීයව නිපයූ බාස්මති ආකාර ප්‍රභේදයක් At 405 හෙවත් ලංකා සමෘද්ධි ලෙස දැනටමත් නිර්දේශ කර හඳුන්වා දී තිබේ. කෙසේ නමුත් එම ප්‍රභේදය ගොක් මැස්සා හානියට ඉතා පාත්‍ර අතර, ධාන්‍ය දුර්වර්ණ වීමද දක්නට ලැබේ. තවද වී කරල මතුවීම සහ පිසූ සහලේ ගුණාත්මයද තරමක් දුර්වල බැවින් At 405 ප්‍රභේදය ගොවීන් අතර මෙන්ම දේශීය පාරිභෝගිකයන් අතරද එතරම් ජනප්‍රිය නොවේ.

මේ නිසා වඩා දියුණු කළ ප්‍රභේදයක් ලෙස **At 306** ප්‍රභේදය හැඳින්විය හැකි අතර එය දිවයිනේ සියළු වී වගා ප්‍රදේශ සඳහා නිර්දේශ කර ඇත. මාස 3 ක් වයසැති සිහින් දිග, සුවඳින් යුතු ධාන්‍ය සහිත මෙම ප්‍රභේදයේ විභව අස්වැන්න හෙක්. ටොන් 6.5 ක් වේ. විවිධ පර්යේෂණ දත්ත යටතේ ලබාදුන් අස්වැන්න වගු අංක 1 හි සඳහන් වේ. මෙය ශාක ඇඳවැටීමට හා ප්‍රධාන පළිබෝධක හා රෝගයන්ට ප්‍රතිරෝධී වේ.

බත්වල ගුණාත්මය At 405 ට වඩා ඉහල තත්ත්වයෙන් පවතී. මෙම ප්‍රභේදය ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනයෙන් හඳුන්වාදුන් පෙළපතක් වන IR 49517-41-16-23, හා At 405 යන ප්‍රභේද අතර දෙමුහුන් වලින් උපදවා ඇත.

මෙම ප්‍රභේදය At 306 ලෙස නිර්දේශ කර නිකුත් කිරීමට පෙර, පරීක්ෂණ පවත්වන ලද්දේ At 576 යන නාමයෙනි (වගුව 2).

**වගුව 1: විවිධ පර්යේෂණ තත්ව යටතේ ලබාදුන් අස්වැන්න**

| අත්හදාබැලීම් සිදුකළ ආකාරය | අත්හදාබැලීම් සංඛ්‍යාව | ධාන්‍ය අස්වැන්න (හෙක්ටයාරයට ටොන්) |
|---|---|---|
| පර්යේෂණ ආයතන අත්හදා බැලීම් | 05 | 5.5 |
| සම්බන්ධිකරණ අත්හද බැලීම් | 23 | 3.9 |
| ප්‍රභේද අනුවර්තිතා පර්යේෂණ | 34 | 4.4 |
| මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 62 | 4.3 |

**වගුව 2: At 306 සහ At 405 (ලංකා සමෘද්ධි) ප්‍රභේදවල වැදගත් ලක්ෂණ**

| ලක්ෂණ | At 306 | At 405 |
|---|---|---|
| **පොදු ලක්ෂණ** | | |
| පැළෑටි උස (සෙ.මී.) | 9.2 | 10.8 |
| කරල් එළියට මතුවීම | හොඳයි | දුර්වලයි |
| මේරීමට ගතවන කාලය (බීජ වැපිරීමේ සිට) | 90 | 120 |
| **ධාන්‍ය** | | |
| දිග (මි.මී.) | 10.7 | 10.0 |
| පළල (මි.මී.) | 2.2 | 2.0 |
| ධාන්‍ය 1000 ක බර (ග්‍රෑම්) | 26.0 | 22.0 |
| **සහල් වල ලක්ෂණ** | | |
| දිග (මි.මී.) | 7.5 | 6.9 |
| පළල (මි.මී.) | 1.8 | 1.7 |
| හැඩය | සිහින් දිගැටි | සිහින් දිගැටි |
| **සහල් සැකසීම** | | |
| මුළු සහල් අස්වැන්න% | 78.5 | 80.5 |
| නොකැඩුනු සහල්% | 44.0 | 58 |
| **පිසීමේ ලක්ෂණ** | | |
| අනුපාතිකව දික්වීම | 1.51 | 1.47 |
| ඇලෙන සුළු බව | අඩුයි | වැඩියි |
| සුවඳ | ඇත | ඇත |
| **ජෛව හා පාරිසරික බලපෑම්වලට ප්‍රතික්‍රියාකරන ආකාරය** | | |
| ඇද වැටීම | ඔරොත්තු දේ | ඔරොත්තු දේ |
| දුඹුරු පැල කිඩෑවා | R | MR |
| ගොක් මැස්සා | MS | S |
| පැල මැක්කා | MR/MS | MS |
| කොල පාළුව | MR | MS |
| බැක්ටීරියා කොළ අංගමාරය | MR | MS |

R - ප්‍රතිරෝධී MR - මධ්‍යස්ථ ප්‍රතිරෝධී

MS - මධ්‍යස්ථ පාත්‍ර S - පාත්‍ර

*මූලාශ්‍රය : බී.ඩී. පතිනායක, ස්ථානභාර පර්යේෂණ නිලධාරී, වී පර්යේෂණ ආයතනය, අම්බලන්තොට.*

## වාසනා - තෙත් කළාපයට නිර්දේශිත නව අමුමිරිස් *(Capsicum annum L)* ප්‍රභේදයක්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එම්.අයි-1, එම්.අයි-2, කේ.ඒ.-2 සහ අරුනළු ලෙස මිරිස් ප්‍රභේද 4ක් නිර්දේශ කර ඇත. වියළි මිරිස් නිෂ්පාදනයට වඩාත් සුදුසුවීම නිසා එම්.අයි-2 ප්‍රභේදය ගොවීන් අතර ජනප්‍රිය වී ඇත. අමුමිරිස් සඳහා ඉහළ අපනයන ඉල්ලුමක්, විශේෂයෙන් මැද පෙරදිග කළාපයෙන් දක්නට ලැබේ. එහෙත් දැනට නිර්දේශිත ප්‍රදේශවල කරල්, අමුමිරිස් ලෙස කල්තබා ගැනීමේ ගුණාත්මය දුර්වල මට්ටමක පවතින බැවින් ගුණාත්මයෙන් ඉහළ අමුමිරිස් සඳහා සුදුසු ප්‍රභේදයක් හඳුන්වාදීමේ පර්යේෂණ අවශ්‍යතාවයක් පැන නැගුනි. මේ අනුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ජානප්ලාස්ම එකතුව හා හඳුන්වා දුන් දර්ග භාවිතා කර සුදුසු ප්‍රභේදයක් සඳහා පර්යේෂණ පවත්වන ලදී.

ඒ අතුරින් තෝරාගත් දර්ශය “වාසනා” නමින් තෙත් කළාපය සඳහා සුදුසු ප්‍රභේදයක් ලෙස නිර්දේශ කර ඇත. මෙම ප්‍රභේදය බැක්ටීරියා හිටු මැරීමට සහ පත්‍ර සිහින්වීමේ අසාමාන්‍යතාවයට ඔරොත්තු දේ. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට ටොන් 14.5 ක් පමණ වේ.

## ලංකා යෙලෝ වැක්ස් - නව මාළු මිරිස් ප්‍රභේදයක්

මෙම ප්‍රභේදය සී ඒ-8 හා හන්ගේරියන් යෙලෝ වැක්ස් යන ප්‍රභේද අතර දෙමුහුමෙන් නිපදවා ඇත. හන්ගේරියන් යෙලෝ වැක්ස් ප්‍රභේදය ශ්‍රී ලාංකීය ගොවීන් අතර වඩාත් ජනප්‍රිය ප්‍රභේදයකි. එහෙත් එය බැක්ටීරියා හිටු මැරීමට වඩාත් පාත්‍ර බැවින් ඉදිරි කන්න සඳහා ස්වයං බීජ නිෂ්පාදනය ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. මේ නිසා බොහෝ විට ආනයනය කළ බීජ මිළදී ගැනීමට සිදුවේ. එමෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත ප්‍රභේදය වන සීඒ.8 ප්‍රභේදය බැක්ටීරියානු හිටු මැරීමට මධ්‍යස්ථ ප්‍රතිරෝධීභාවයක් පෙන්වන නමුත් කරල් වල අක්‍රමවත් හා ඒකාකාරී නොවන ස්වරූපයක් නිසා ගොවීන් අතර එතරම් ජනප්‍රියතාවයක් නොමැත. මේ නිසා ඉහත තත්ත්ව බොහෝ දුර මඟහරවා ගැනීම සඳහා නව ප්‍රභේදය හඳුන්වා දී ඇත. ලංකා යෙලෝ වැක්ස් බැක්ටීරියා හිටුමැරීමට ඔරොත්තු දෙන අතර, ඉහළ ගුණාත්මයෙන් යුතු කරල් සහිත වේ. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට ටොන් 30-40 ක් පමණ වේ.

## සම්පත්-නව දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයක්

මෙය මහඉලුප්පල්ලම පර්යේෂණ ආයතනය විසින් නිපදවන ලද දෙමුහුමකි. පරිනතවීම සඳහා දින 105-110 ක පමණ කාලයක් ගතවේ.

යල සහ මහ කන්න දෙකෙහිම වගා කිරීම සඳහා උචිත වේ. විශාල දිගු කරල් සහිත, ඉහළ අස්වනු ලබා දෙන ප්‍රභේදයකි. මධ්‍යස්ථ පැලැටි උසකින් යුතු අතර, ශාක ඇද වැටීමට ඔරොත්තු දේ. පොහොර සහ නිවැරදි ජල පාලනයට ඉහළ ප්‍රතිචාරයක් දක්වයි. “සම්පත්” ලෙස නම්කර ඇති මෙම ප්‍රභේදය ශ්‍රී ලංකාවේ නිපදවන ලද ප්‍රථම දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදය ලෙස හැඳින්විය හැක.

## පිපිඤ්ඤා ප්‍රභේද

ඉහළ අස්වනු ලබා දෙන නව ප්‍රභේද 2 ක් නිර්දේශ කර ඇත. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට ටොන් 20-25 ක් පමණ වේ. තිත්ත රසය ගෙඩිවල දක්නට නොලැබීම මෙම දෙවර්ගයේම විශේෂිත ගුණාංගයක් ලෙස හැඳින්විය හැකිය. පරපරාගණය වන ප්‍රභේදයන් වේ.

**මාකඳුර වරණය**

ආකර්ශණීය බාහිර පෙනුමක් සහිත ඵල, සුදුමය කොළ පැහැති වේ.

**චැම්ප් 320**

දිගැටි ඵල කොළ පැහැති වේ. නොමේරු ගෙඩිවල මෙම කොළ පැහැය වඩාත් තිව්‍ර වේ. මේ නිසා මෙය අපනයනය සඳහා යෝග්‍ය, සලාද ආකාර ප්‍රභේදයක් ලෙස හඳුන්වා දී ඇත.

## බින්දු - තිබ්බටු ප්‍රභේදයක්

තිබ්බටු ස්වපරාගනය සිදුවන, ගෙවතු හා ගෙවතු ආශ්‍රිත ප්‍රදේශ වල දක්නට ලැබෙන ශාකයකි. තිබ්බටු සඳහා පවතින ඉහළ වෙළෙඳපොළ අගය නිසා වාණිජ වගාවන් ලෙස වගාව සඳහා වැඩි විභවයක් දක්නට ලැබේ. එහෙත් මේ සඳහා නිර්දේශිත ප්‍රභේදයන් නොමැති වූ බැවින් "බින්දු" යන නාමයෙන් තිබ්බටු ප්‍රභේදයක් හඳුන්වා දෙන ලදි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට ටොන් 12-14 ක් පමණ වේ. මාස 6 ක පමණ වගා කාලයක් සහිත ප්‍රභේදයකි.

*මූලාශ්‍රය : ජාතික ප්‍රභේද නිර්දේශ කිරීමේ කමිටුව*

### කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිතුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.**

# රා.සේ.පි.

**මුද්‍රිත ද්‍රව්‍යය**
**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 7 අංක 2 2005 මාර්තු- අප්‍රේල්

# කෘෂි පුවත්

## අචාර්ය සී. කුඩාගමගේ මහතා නව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත්වේ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්ෂ ජනරාල් වරයා ලෙස ආචාර්ය චන්ද්‍රසිරි කුඩාගමගේ මහතා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් පත්කර ඇත. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන ඔහු අධ්‍යක්ෂ ජනරාල් හැටියට පත් වීමට ප්‍රථම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේය.

1972 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයෙන් විද්‍යා උපාධිය ලැබූ කුඩාගමගේ මහතා 1974 දී පර්යේෂණ නිලධාරියෙකු ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඇතුලත් විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිය රාජකාරී කාලයෙන් වැඩි කලක් කිට විද්‍යා පර්යේෂණයෙහි නිරත වූ එතුමා වර්ෂ ගණනාවක් කෘමි ප්‍රතිරෝධී වී ප්‍රභේද අභිජනන කාර්යාවලියට ද සම්බන්ධ විය. ඇමරිකා එක්සත් ජනපදයේ පර්ඩියු විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (M.Sc) හා ශාස්ත්‍රපති (Ph.D) උපාධි උපයාගත් කුඩාගමගේ මහතා වර්ෂ 14 ක් බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ සේවය කර ඇත. 1994 දී ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ධූරයට පත් වූ ඔහු 1999 දී එම ආයතනයේ අධ්‍යක්ෂ ධූරයට පත්විය.

කෘමි ප්‍රතිරෝධී වී ප්‍රභේද අභිජනන සහ ඒකාබද්ධ පලිබෝධ පාලනය සඳහා ඔහුගෙන් ලැබුණු විශිෂ්ඨ පර්යේෂණ දායකත්වය



ආචාර්ය සී. කුඩාගමගේ මහතා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ රාජකාරි භාරගත් අවස්ථාව

වෙනුවෙන් 1980 දී ජනාධිපති සම්මානයෙන් ද ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් පිරිනමන සෙරෙස් සම්මානයෙන් ද, 1998 දී ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති සභාවෙන් පිරිනැමූ CARP සම්මානයෙන් ද ඔහු පිදුම් ලැබීය.

## හම්බන්තොටින් දහයියා වලට හොඳ මිලක්

වී වගාව සඳහා කාබනික පොහොර යෙදීමට ගොවීන් දිරිගැන්වීම සඳහා ශ්‍රමදානයක් සමඟ ක්ෂේත්‍ර වැඩසටහනක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග ඇමති ගරු අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් 2005 අප්‍රේල් මස 25 දින හම්බන්තොට බැරගම යායේදී පැවැත්විනි.

කාබනික පොහොරක් ලෙස වී වගාවට දහයියා අඟුරු යෙදීම ගොවීන් අතර ප්‍රචලිත වෙමින් පවතී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් සරල කුන්තාන් නම් උපකරණය භාවිතා කර ගොවීන් තමන්ගේ කුඹුරට අවශ්‍ය දහයියා අඟුරු ප්‍රමාණය (අක්කරයට කිලෝ ග්‍රෑම් 250 ක් පමණ) නිපදවා ගනිති. දහයියා අඟුරු වලට පවතින ඉහළ ඉල්ලුම හේතුවෙන් දහයියා අඟුරු අලෙවිකර අමතර ආදායමක් ලබා ගැනීමට ද ගොවීන් යොමු වී ඇත. සාමාන්‍යයෙන් අක්කරයක් සඳහා අවශ්‍ය දහයියා අඟුරු ප්‍රමාණය රුපියල් 600 ක පමණ මුදලකට එම ප්‍රදේශයේදී අලෙවි කරනු ලබයි.



අලෙවිය සඳහා සකසා ඇති දහයියා අඟුරු තොගයක් ගරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග ඇමති අනුර කුමාර දිසානායක මහතාගේ අවධානයට යොමුකළ අවස්ථාව

**ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික අංශයෙන් විශිෂ්ඨ දියුණුවක් අත්කර ගනිමු**



කුන්තාන් උපකරණය භාවිතයෙක් කර කළ දහයියා ජලය යොද සිසිල් කරන අවස්ථාවක්

වී වගාවට කාබනික පොහොරක් ලෙස දහයියා අඟුරු යෙදීමෙන් වාසි රැසක් ලබාගත හැකි බව වී වගා කරන ගොවි මහතුනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන විශේෂිත පණිවුඩයකි. දහයියා අඟුරු යෙදීමෙන්

- යොදන රසායනික පොහොර වල කාර්යක්‍ෂමතාව වැඩි වේ. එනම් යෙදූ රසායනික පොහොර දහයියා වල තිරකර සෙමෙන් නිකුත් කිරීම නිසා පෝෂක වැඩිකාලයක් රඳවා තබාගෙන බෝගයට නිදහස් කිරීම සිදුවේ.
- දහයියා අඟුරු හොඳ සිලිකන් ප්‍රභවයක් වන අතර එමඟින් බෝගයට රෝග හා පළිබෝධ තත්‍වයනට ඔරොත්තු දීමේ හැකියාව ලබාදෙයි.
- පසේ ඇතිවන ලවණ තත්ව නිසා බෝගයට වන බලපෑම අවම කරවයි.
- පසේ ජලය රඳවා තබා ගැනීමේ හැකියාව වැඩි කරයි.
- පාංශු වාතනය සහ පාංශු ව්‍යුහය ද දියුණු කරයි.

මෙම ක්‍ෂේත්‍ර වැඩසටහන සඳහා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මහතා, පළාත් සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ද සහභාගී විය.

## ඩිජිටල් කෘෂි ව්‍යාප්ති ක්‍රමවේදය (DIGITAL AGRICULTURE EXTENSION)

දියුණු රටවල ගොවීන් කෘෂිකාර්මික තාක්ෂණය ලබා ගැනීමේ කටයුතු සඳහා සයිබර් ව්‍යාප්ති ක්‍රම වැනි අන්තර් ජාලය භාවිතා වන නවීන විදුලි සංදේශ ක්‍රම උපයෝගී කර ගනී. මේ නිසා ගොවීන්ට සිය වගාවන්ට අදල වන තාක්‍ෂණික තොරතුරු ඉතා පහසුවෙන් හා ඉක්මණින් ලබා ගැනීමට මඟ සැලසී ඇත. වැඩි ප්‍රමාණයක් දුප්පත් ගොවි ජනතාවගෙන් සමන්විත ශ්‍රී ලංකාව වැනි රටවලට එවැනි තොරතුරු සංනිවේදන තාක්ෂණය හා සයිබර් ව්‍යාප්තිය වැනි ක්‍රම කරා යාම තවමත් ප්‍රායෝගික නොවේ. එයට ප්‍රධාන හේතු ලෙස දුරකථන සම්බන්ධතාවය ලබා ගැනීමේ ගැටළු හා සංනිවේදන පහසුකම් සඳහා වැය වන අධික මිල නම් කළ හැකිය. එහෙයින් ඩිජිටල් තාක්‍ෂණ ව්‍යාප්ති ක්‍රමවේදයේ වාසි ශ්‍රී ලංකාවේ ගොවිමහතුන් හට ලබාදීම සඳහා වෙනත් විකල්ප සයිබර් ව්‍යාප්ති ක්‍රමයක් හඳුන්වා දීමට කෘෂිකර්ම දෙපාර්මේන්තුව සමත්වී ඇත. මෙම ක්‍රමය භාවිතයෙන් කෘෂි තාක්‍ෂණය හා ගොවි ගැටළු විසඳීම ඉක්මණින් මෙන්ම ආකර්ශණීය අයුරින් සිදු කල හැකි වේ.

මෙය ග්‍රාමීය කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථාන (ගොවිජන කේන්ද්‍ර) 35 ක වෙසෙන ගොවි ජනතාව සඳහා නියමු මට්ටමින් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ධාන්‍යාගාර වැඩ සටහන හා කෘෂිකර්ම ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍යාධාර සපයනු ලබයි.

මෙම ඩිජිටල් ව්‍යාප්ති ඒකක අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය සංගත තැටි (Interactive Multimedia CD ROM), පරිගණකයක්, ස්කෑන් යන්ත්‍රයක්, ඩිජිටල් කැමරාවක්, කොම්පියුටර් මුද්‍රණ යන්ත්‍රයක් යන අංග වලින් සමන්විත වේ.

ගන්නොරුව ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය විසින් ප්‍රධාන බෝග 13 ක් සඳහා මෙම බහුමාධ්‍ය සංගත තැටි නිපදවා එම මධ්‍යස්ථාන වලට ලබාදී ඇත. සිංහල මාධ්‍යයෙන් නිපදවා ඇති මෙම සංගත තැටි පරිගණක පිළිබඳ පළපුරුද්දක් නොමැති අයට වුවද පහසුවෙන් භාවිතා කළ හැකි ආකාරයට සරලව සකසා ඇත. උපදෙස් ලබා ගැනීමට හා ගැටළු හඳුනා ගැනීමට පැමිණෙන ගොවීන්ට මෙම තැටි භාවිතා කර අදල දැනුම ලබා ගැනීමට මේ නිසා හැකි වේ.

කොම්පියුටරය භාවිතා කර එම තැටිවල අඩංගු වැදගත් කරුණු යොද ගොවි පුහුණු පංති සඳහා අවශ්‍ය වන පුහුණු ආධාරක නිපදවීමට හැකි පහසුකම් වලින්ද මෙම ඒකකය සමන්විත වේ. පිටු පෙරලනය (flip chart) වැනි අඩු වියදම් පුහුණු ආධාරක නිපදවා පුහුණු කටයුතු සඳහා යොදා ගැනීම ද මෙයින් බලාපොරොත්තු වේ. මෙම තැටි ඕනෑම අයෙකුට මිළදී ගැනීමට හැකි අතර, වැඩි විස්තර ගන්නොරුව ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයෙන් ලබා ගත හැක.

### දැනට මිලදී ගත හැකි සංගත තැටි:

1. වී වගාව
2. අර්තාපල් වගාව
3. කෙසෙල් වගාව
4. තක්කාලි වගාව
5. බටු වගාව
6. බිම්මල් වගාව
7. බීළුණු වගාව
8. රතුළූණු වගාව
9. මිරිස් වගාව
10. පිටුපෙරලන සැකසීම
11. ඇන්තූරියම් වගාව (ඉංග්‍රීසි)
12. රාජකීය උද්භිද උද්‍යානය (ඉංග්‍රීසි)
13. එළවළු වගාවේ කෘමි පළිබෝධ පාලනය (ඉංග්‍රීසි)

*මූලාශ්‍රය : ආචාර්ය ආර්. විජේකෝන්, ස.කෘ.අ. ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය ගන්නොරුව*

## යාය නිෂ්පාදන ගොවි සමිති ස්ථාපිත කිරීම පිළිබඳ විශේෂ මූලධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයේ නියැලෙන ගොවි ජනතාවට බලපාන විවිධ ගැටළු මඟහරවා ගැනීම සඳහා ක්‍රියාකාරී සවිමත් ගොවි සමිති බිහි කිරීම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ මූලික අරමුණ වී ඇත. එම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් කෘෂිකර්ම දෙපාර්මේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය 2005 වර්ෂයේදී යාය නිෂ්පාදන ගොවි සමිති ස්ථාපිත කිරීම පිළිබඳවූ විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

දැනට පිහිටුවා ඇති යාය නිෂ්පාදන ගොවි සමිති සවිබල ගැන්වීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වේ. සාමුහික ක්‍රියාකාරකම් තුලින් යාය නිෂ්පාදන සමිති සාමාජික ගොවීන්ගේ භෝග නිෂ්පාදන ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමටද, අලෙවි හැකියාවන් වර්ධනයට මෙන්ම, වෙළඳපොළ තරඟකාරීත්‍වයට සංවිධානාත්මකව මුහුණ දීමට ද සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය සහාය ලබාදීමට ව්‍යාපෘතිය මඟින් කටයුතු කරනු ඇත. මෙහිදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධතාව ගොඩනංවමින් ගොවි සමිති ක්‍රියාශීලීව හා තිරසාරව පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික පසුබිම සකස් කෙරේ.

ව්‍යාපෘතිය පියවර කීපයකින් දියත් කෙරේ. මූලිකව ගොවි සමිති ක්‍රියාවලියේ පහසුකම් සලස්වන්නන් ලෙස ක්‍රියාත්මක වන නිලධාරීන්හට ඒ සඳහා කුසලතා වර්ධනයටද, සහභාගිත්ව සැලසුම්කරණය පිලිබඳව දැනුම වර්ධනයටද පියවර ගනු ඇත. දෙවනුව ඔවුන්ගේ සහායෙන් ගොවි සහභාගිත්වය උපරිම ලෙස යෙදන පරිදි සහභාගිත්ව ප්‍රවේශයකින් යාය නිෂ්පාදන සමිති 3000ක් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට කටයුතු කරනු ඇත. මෙසේ

සකස් කරනු ලබන ප්‍රජා ක්‍රියාවලි සඳහා අවශ්‍ය පරිදි අනුග්‍රහයන් ලබාදීමටද කටයුතු කෙරේ. ගොවීන් සවිබල ගැන්වීම හේතුකොටගෙන නිෂ්පාදන ප්‍රවර්ධනයකට යොමුවීමක් ඉටුවන අතරම, මූල්‍යමය වශයෙන් ශක්තිමත් වීමට හැකිවන පරිදි සමිති සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවීමට අඩිතාලමද සකස්වනු ඇත. රජය විසින් ලබාදෙන මූල්‍ය ආධාරය මුදල් ලෙස නොව යෙදවුම් ලෙස ගොවි සමිතියට ලබාදීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය මෙන්ම සියළුම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුද දායකත්වය දරයි.

*මූලාශ්‍රය: එස්.එච්.එම්.පී. සමරසිංහ මයා, අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) අංශය, පේරාදෙණිය.*

## සුළු පරිමාන වාණිජමය එළවළු වගාවක් සඳහා සූර්ය බල බිංදු ජල සම්පාදනය

ශ්‍රී ලංකාවේ කුඩා ගොවිබිම්ලාභීන්ට නවීන කෘෂිකාර්මික තාක්ෂණයක් වන සූර්ය බල බිංදු ජල සම්පාදනය යටතේ එළවළු බෝග වගා කිරීම සඳහා අවස්ථාවක් උදා වී ඇත. කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ඕස්ට්‍රේලියානු රජයේ සහන ණයක් ලෙස ලබාදෙන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක මෙම වැඩ සටහන තිරසාර කෘෂිකර්ම ජල කළමණාකරන ව්‍යාපෘතිය ලෙස නම් කර ඇත.

පසුගිය වසර 10 කට ආසන්න කාලයක බිංදු ජල සම්පාදන තාක්ෂණයෙන් ලද අත්දැකීම් පදනම් කර ගෙන සූර්යාලෝකයෙන් විදුලිය ජනනය කර එමඟින් විදුලි ජල පොම්පයක් ක්‍රියාත්මක කර අක්කර 1/2 ට ආසන්න ඉඩම් ප්‍රමාණයකට බිංදු ක්‍රමය මඟින් ජලය සැපයීම මෙහි මූලික ලක්ෂණය වේ.

විදුලි ජනනය සඳහා වොට් 150 ක සූර්ය පැනලයක්, විදුලි ජනක වෝල්ටීය පාලක උපකරණයක්, විශේෂිත ජල පොම්පයක්, පොහොර යෙදීමේ උපාංග කට්ටලයක් හා අක්කර 1/2 කට ආසන්න ප්‍රමාණයක බිංදු ජල නල පද්ධතියක් යන උපාංග මෙම කට්ටලයට අයත් වේ.

සූර්ය පැනලයෙන් ජනනය වන විදුලිය, විදුලි ජනක වෝල්ටීය උපාංග කට්ටලය මඟින් ඩී.සී. විදුලිය බවට හැරවීමෙන් පසු එමඟින් ජල පොම්පය ක්‍රියාත්මක වී බිංදු ජල පද්ධතිය ක්‍රියාත්මක වේ. බිංදු ජල නල පද්ධතියේ පරතරය මීටර් 1.2 වන අතර එමඟින් සාර්ථකව එළවළු වගා කළ හැකි වේ.

විදුලිය හෝ ඉන්ධන වැය වීමකින් තොර හිරු එළිය පවතින දිනවලදී දිනකට ජලය ලීටර් 8000 ක උපරිමයකට යටත්ව දිනකට පැය 07 ක පමණ කාලයකදී ජලය ලීටර් 6000 - 7500 ක් වගාව සඳහා බිංදු ක්‍රමය යටතේ ලබාදිය හැකි වේ.

මෙම ක්‍රමය භාවිතයෙන් ජලය මෙන්ම විදුලිය හා ඉන්ධන ඉතිරි කර ගත හැකි වීම, එළවළු අස්වනු දෙගුණ කර ගත හැකි වීම, එළවළු වගාවේ අවාරයන් ඉලක්ක කර අස්වනු ලබා ගත හැකිවීම හා ඉහළ ගුණාත්මක අස්වනු ලබා ගත හැකිවීම තුළින් ඉහළ වෙළඳපල මිලක් ලබාගත හැකිවීම යන ප්‍රතිලාභ සුළු ගොවීන්ට අත්පත් කර ගත හැකි වේ. සුළු ගොවීන්ට මෙම පද්ධතියක් ලබා ගැනීම සඳහා ගෘහස්ථ ළිඳක් හෝ කෘෂි ළිඳක් සහිත අක්කර 1/2 ක ගොඩ ඉඩමක් හිමි විය යුතුයි. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි හෝ කෘෂිකර්ම උපදේශක මඟින් මේ සඳහා ඉල්ලුම් කළ යුතුය. වසර 03 ක නඩත්තුව හා සේවා කටයුතු ඇතුලත් මෙම පද්ධතියේ මුළු වටිනාකම රු. 3,00,000/= ක් පමණ වන අතර රු. 5,000/= ක මූලික ගෙවීමක් කර මෙයට දායක විය හැක. පළමු වසර තුළදී පද්ධතියේ වටිනාකම සඳහා ගෙවීම් සිදුකිරීමෙන් නිදහස් වනු ඇත. වසර 10 ක් වැනි කාලයක් තුළ සහන ණය ක්‍රමයකට පොලී රහිතව පද්ධතියේ වටිනාකම ගොවිජන බැංකුව හරහා පියවීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරින් හා ගොවීන් පුහුණු කිරීමෙන් අදාල තාක්ෂණික දැනුම ගොවීන්ට ලබා දෙන අතර ලංකාවේ වියළි හා අන්තර් මාධ්‍ය කලාපීය සුළු ගොවීන්ගේ ආදයම් තත්වය වැඩි දියුණු කිරීම සඳහා මෙවැනි වාරි කට්ටල 5000 ක් ගොවීන් වෙත ලබාදීමට සැලසුම් කර ඇත.

නියාමක ව්‍යාපෘතිය ගලේවෙල, මහව අධිකාරීගම සහ රන්දෙණිගල ප්‍රදේශ වල ගොවීන් සමග ක්‍රියාත්මක කර ඇති අතර, පුහුණු කිරීමේ කටයුතු සඳහා ආදර්ශ කට්ටල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාරියපොල, අඟුණකොළපැලැස්ස, බිබිල, අනුරාධපුර - පුලියන්කුලම යන පුහුණු මධ්‍යස්ථානවල ස්ථාපිත කර ඇත.

*මූලාශ්‍රය: ආර්.එස්. විජේසේකර මහතා ස.කෘ.අ.(ව්‍යාප්ති හා පුහුණු) අංශය, පේරාදෙණිය.*

# පර්යේෂණ තොරතුරු

## බද්ධ මැංගුස්ටීන් වගාව

ඉතා මිහිරි පළතුරක් වන මැංගුස්ටින් වගාවේ ප්‍රධාන ගැටළු 2 කි. එනම් බීජ මගින් ප්‍රචාරණය කෙරෙන මෙම පළතුරු වර්ගයෙන් පළමු අස්වැන්න ලබා ගැනීමට වසර 10-12 කට වඩා වැඩි කාලයක් ගතවීම හා ගෙඩියට කිරි වැස්සීමේ තත්වය නිසා එම ගෙඩි ආහාරයට ගැනීමට නොහැකි වීමය. මේ නිසා කෙටි කලකින් අස්වනු ලබා ගැනීමට ඉවහල් වන බද්ධ ක්‍රම භාවිතයෙන් පැළ සකස් කිරීම පිළිබඳ පර්යේෂණ 1982 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මේ සඳහා කුඤ්ඤ බද්ධ ක්‍රමය උපයෝගි කරගනු ලැබීය. මැංගුස්ටින් ගසේ මූල පද්ධතිය දුර්වලය. ඒ නිසා ශක්තිමත් මූල පද්ධතියක් ඇති මැංගුස් පවුලේ අනෙක් සාමාජිකයන් වන ගොරකා සහ රට ගොරකා වගීද මූල ග්‍රාහක (root stock) ලෙස යොදා ගැනීමේ හැකියාව අත්හදා බැලුවත් එයින් එතරම් සාර්ථක ප්‍රතිඵල එම කාලයේ නොලැබිණ. මෙයට අමතරව අතු බැඳීමේ ක්‍රම අත්හදා බැලූවත් එයින්ද සාර්ථක ප්‍රතිඵල නොලැබිණි.

දැනට ඇති විවිධ වයස් කාණ්ඩයට අයත් මැංගුස්ටීන් බද්ධ පැළ මේ පර්යේෂණ වලින් බිහිවූ අතර වැඩිම වයසක් වූ මැංගුස්ටීන් බද්ධ පැළයට වයස අවුරුදු 19 කි. මෙම බද්ධ පැළ වල ග්‍රාහකය සහ අනුජය යන දෙකොටසම මැංගුස්ටින් වන අතර කුඤ්ඤ බද්ධ ක්‍රමයට සැකසූ ඒවා වේ.

### බද්ධ පැළ වල වර්ධනය

බීජ පැලයක් ලෙසම බද්ධ පැළ වලද වර්ධනය සිදුවන්නේ ඉතා සෙමිනි. වසර 19 ක්වූ බද්ධ පැළයක උස මීටර 2 ක් වන අතර, එම වයසේ වූ බීජ පැළයක උස මීටර 6 ක් වේ. තවද මෙවැනි වයසේ වූ බද්ධ පැළයක ශාක වියනේ පළල මීටර 3ක්

වන අතර, බීජ පැළයක ශාක වියන මීටර 7 ක පළලකින් යුක්ත විය. මෙම වර්ධක වර්ධනයෙන් පෙනෙන්නේ මැංගුස්ටින් බද්ධය මගින් කුරු ශාකයක් ඇතිවී ඇති බවය. බීජ මැංගුස්ටින් ගස මෙන්ම වැඩුන බද්ධ මැංගුස්ටින් ගසක් කේතු ආකාර ස්වරූපයක් ගනී. එහෙත් මෙම බද්ධ ගස් වල අතු පතර පරතරය අඩු නිසා භෝග වියන ඉතා සංයුක්ත ආකාරයක් ගනී (රූපය I).



රූපය I : අවුරුදු 18 ක් වයසැති බද්ධ මැංගුස් ගසක්

## ඵල හට ගැනීම

බොහෝ මැංගුස්ටින් බද්ධ පැළ වලින් වසර 2-3 අතර කාලයකදී ඵල හට ගනී. ගස කුඩා නිසා මෙවැනි ගස් වලින් ගෙඩි 3-4 කට වඩා හට නොගැනුණි. වසර 10 ක් පමණ වනවිට බද්ධ ගස් වලින් ලැබුණේ ගෙඩි 25-30 ක් පමණි. වසර 19 ක් වන බද්ධ ගසකින් ලබාගත හැකි වූ අස්වැන්න වූයේ ගෙඩි 70-80 කි. එම වයසේ වූ බීජ පැළයකින් ගෙඩි 300 ක පමණ අස්වැන්නක් ලබා ගත හැකි විය.

## ගෙඩි වලින් කිරි වෑස්සීමේ තත්ත්වය/ගම්බෝජි රෝගය

මැංගුස්ටින් නටුව දිගේ “කහ පැහැති කිරි” ගෙඩියට වෑස්සීම නිසා එවැනි ගෙඩි ආහාරයට ගැනීමට නොහැකි තත්වයකට පත්වීම ගම්බෝජි රෝගය ලෙස හඳුන්වයි. මෙය කායික විද්‍යාත්මක තත්වයකි. මෙම අයහපත් ලක්ෂණය බද්ධ මැංගුස්ටින් ගස් වලද පවතී. බීජ පැළවල මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා ප්‍රධාන මූල ද්‍රව්‍ය නිසිලෙස ලබාදීම, පසට හුණු යෙදීම, බෝරෝන් වැනි අංශු මාත්‍ර මූලද්‍රව්‍ය යෙදීම වැනි ප්‍රතිකාරක භාවිතා කර පර්යේෂණ දශකයක් මුළුල්ලේ සිදුකලත් එතරම් පිටුවහලක් නොවිණි.

## වගා කරන්නන් හට නිර්දේශ

බද්ධ මැංගුස්ටින් පිළිබඳව දශක 2 ක කාලයක් තුළ සිදු කෙරුන පර්යේෂණ වලින් පිළිබිඹු වන්නේ මෙවැනි ගස් කුඩා ගෙවත්තකට ඉතා සුදුසු බවය. බද්ධ මැංගුස්ටින් ශාක “කුරු ස්වරූපයක් ” ගන්නා බැවින්, මෙවැනි ගස් වලට අවශ්‍ය වන්නේ කුඩා ඉඩ ප්‍රමාණයකි. අඩු පරතරයක් ඇතිව මැංගුස්ටින් බද්ධ පැළ සිටුවා ගැනීමෙන් ඒකක භූමි ප්‍රමාණයකින් ලබා ගත හැකි අස්වනු ප්‍රමාණය වැඩිකර ගත හැකිය. කෙසේ නමුත්, මහා පරිමාණ වගාවන් සඳහා බද්ධ මැංගුස්ටින් පැළ නිර්දේශ කළ නොහැකිය.

මූලාශ්‍රය : ආචාර්ය. ඊ.එම්.දසනායක (හිටපු සම්බන්ධීකරණ නිලධාරී - මැංගුස්ටින්)
පැළෑටි වෛරස හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය, හෝමාගම

### කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිතුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

සංස්කරණය
ජයන්තා ඉලන්කෝන්

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

රා.සේ.පි.

මුද්‍රිත ද්‍රව්‍යය
භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 7 අංක 3 2005 මැයි- ජුනි

# දූරියන් පුෂ්ප පරාගනයෙන් ඉහළ අස්වැන්නක්

දූරියෝ සිබෙතිනස් (*Durio zibethinus*) යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන දූරියන්, ආසියාවේ ඇති ඉතා ජනප්‍රිය පළතුරකි. එය ඉතාමත් රස පළතුරක් මෙන්ම මිල ඉතා අධික, පෝෂණ ගුණයෙන් අනූන පළතුරකි. දූරියන් ගසක අධික මල් සංඛ්‍යාවක් හට ගත්ත ද සාපේක්ෂව ඵල හට ගන්නේ සුළු වශයෙනි. මල් නිසි ලෙස පරාගණය නොවීම මීට හේතු වෙතැයි සොයාගෙන ඇත. ස්වාභාවික තත්ව යටතේ මේවා පරාගණය කරනු ලබන්නේ වවුලන් හා රාත්‍රියේ සැරිසරන කෘමීන් වන අතර පුෂ්ප ස්වපරාගණය ඉතාමත් සුළුවෙන් සිදුවන බව සඳහන් වේ. කෘත්‍රිමව අතින් පරාගණය කිරීමෙන් පරාගණය සාර්ථකව කර වැඩි අස්වැන්නක් ලබාගත හැකි බව පර්යේෂණ මගින් සොයා ගෙන ඇත. ඉහල ප්‍රතිඵල ලබා ගැනීමට මෙම කෘත්‍රිම පරාගණය සිදුකළ යුතු නියම අවස්ථාව හෝ එම කාල පරතරය සොයා ගැනීම සඳහා ගන්නොරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දී පර්යේෂණයක් සිදුකරන ලදි. මල්වල ලක්ෂණ හා චර්යාව සොයා බැලීම සඳහා දූරියන් වර්ග 05 ක් වන GA, KN8, KN22, KN61, KN62 පර්යේෂණ සඳහා යොදා ගන්නා ලදි. ස්වපරාගණය සිදුවනවා දැයි සොයා බැලීමට ඉහත දූරියන් වර්ග 05 න් මල් 25 බැගින් ආවරණය කිරීමෙන් ස්වපරාගණය වන්නට සලස්වන ලදි.



රූපය 1 - දූරියන් පුෂ්ප

දූරියන් මල් පොකුරු වශයෙන් පාර්ශ්වික අතුවල හටගනී (රූපය 1). එක පොකුරට සාමාන්‍යයෙන් මල් 25 ක් පමණ හටගන්නා අතර උපරිම වශයෙන් මල් 66 ක් පවතින අවස්ථා ද ඇත. මල් හටගන්නා අවස්ථාවේ සිට විවෘත වීම දක්වා කාලය දවස් 40-50 පමණ වේ. මලෙහි විවිධ කොටස් වල විශාලත්වය, රේණු සංඛ්‍යාව හා පෙතිවල පැහැය ආදියෙහි දක්වන විවිධත්වය දූරියන් වර්ග හඳුනා ගැනීමට යොදා ගත හැක.

දූරියන් ස්වපරාගණය සඳහා ඉතා අඩු නැඹුරුතාවක් පෙන්වන බැවින් (0% - 10%) වාණිජ වගාවක් සඳහා නිර්දේශිත වර්ග කිහිපයක් වගා කිරීම සුදුසු වේ. මල් සම්පූර්ණයෙන් විවෘත වන්නේ ප.ව. 4.00 පමණ වන අතර පරාගධානි පුපුරා පරාග පිටවීමට පටන් ගන්නේ ප.ව. 6.00 න් පසුවය. තවද පෙ.ව. 11.00 පමණ සිට කලංකය ග්‍රාහිවීම ආරම්භ වේ. නමුත් වර්ග අනුව හා පරිසරයේ ආලෝක තීව්‍රතාවය අනුව මෙම කාල වල සුළු වෙනස්කම් දක්නට ලැබිණි. පරාගනය සිදු කිරීමේදී ඉහත සඳහන් පරිදි පරාග ලබාගත යුත්තේ වෙනත් ගසකිනි. පරාග පිටවන්නේ ප.ව. 6.00 න් පසුව බැවින් දහවල් කාලයේ පරාගනය සඳහා පෙර දින කඩා ශීතකරණයේ තැබූ මල් යොදා ගන්නා ලදි. ප.ව. 6.00 න් පසුව නම් එදිනම පිපෙන මල් මේ සඳහා යොදා ගත හැක. තරමක් දුරින් පිහිටි ගසකින් පරාග ලබාගන්නේ නම් පහසුව සඳහා ප.ව. 4.00 ට පමණ පිපෙන මල් කඩා එහි නටුව වතුර බඳුනක බහා තැබීමෙන් අවශ්‍ය වේලාවට පරාගණය සඳහා යොදාගත හැක. පරාගධානි මත පැහැදිලිව දැක ගත හැකි ලා කහ පැහැති පරාග අනෙක් මලේ කලංකය මත තැවරීමෙන් පරාගනය සිදු කරනු ලැබේ. මෙම පර්යේෂණයෙන් ප.ව. 1.00 සිට ප.ව. 7.00 දක්වා කෘත්‍රිම පරාගණය සිදු කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබිය හැකි බව සනාථ විය. මෙම කාල පරාසයෙන් ද ප.ව. 7.00 ට පමණ පරාගණය සිදු කිරීමෙන් ඉතා ඉහළ ඵල සංඛ්‍යාවක් ලබාගත හැකි බව සොයා ගන්නා ලදි. පෙරදින පරාග ශීතකරණයක ගබඩා කර පසුදින පරාගනය සඳහා යොදාගත හැකි බව ද සොයා ගන්නා ලදි.



රූපය 2-ඵල හටගන්නා බද්ධ දූරියන් ශාඛයක්

සාමාන්‍යයෙන් බීජ පැළ වලින් හටගත් දූරියන් ගාක ඉතා උසට වැවෙන බැවින් කෘත්‍රිම පරාගනය කිරීම අපහසුය. එහෙත් බද්ධ දූරියන් පැළ වගා කර ගාක පුහුණු කිරීම හා කප්පාදු කිරීම මඟින් උස නොයන වගාවක් පවත්වාගත හැකිය (රූපය 2). එවැනි ගාක වල අතුවල හටගන්නා දූරියන් මල් පහසුවෙන් පරාගනය කළ හැකි වේ.

*මූලාශ්‍රය අයි. මැදගොඩ, ටී.එම්.කේ. තෙන්නකෝන්, ඩබ්.එම්.ජේ.කේ. වන්දුරත්න, එන්.ඩී.ජී. නාකන්දල උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව, පේරාදෙණිය.*

# කෙසෙල් ගුල්ලාගෙන් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට පහසු ක්‍රමයක්

කෙසෙල් ගුල්ලා, ශ්‍රී ලංකාවේ සියළුම කෙසෙල් වගා කරන ප්‍රදේශවල දක්නට ලැබෙන, සියළුම කෙසෙල් ප්‍රභේද වලට හානි කරන, කෙසෙල් වගාවට ඉතාම වැදගත් පලිබෝධකයා ලෙස හැඳින්විය හැක.

බෝග සනීපාරක්‍ෂාව හා කෘමිනාශක භාවිතය මෙම පලිබෝධකයා පාලනය සඳහා දැනට භාවිතා කරන ක්‍රම වේ. කෙසේ නමුත් ශෂ්‍ය ක්‍රම භාවිතයෙන් ද මෙම කෘමියා පාලනය කළ හැකිය. පලිබෝධකයා ගෙන් තොර රෝපණ ද්‍රව්‍ය භාවිතය මින් ඉතා වැදගත් ක්‍රමයයි. පහත සඳහන් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම කෙසෙල් ගුල්ලා පාලනයට යොදා ගත හැකි බව තෙලිජ්ජවිල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ දී සිදු කරන ලද පරීක්ෂණ වලදී අනාවරණය විය.

i. කෙසෙල් පැළ ජලයෙන් යට කිරීම

මෙම ක්‍රමයේදී සිටුවීම සඳහා ගලවාගත් පැළ වල කෝමය කොටස පමණක් පිරිසිදු ජලයේ පැය 48 ක් ගිල්වා තබනු ලැබේ. රෝපණ ද්‍රව්‍ය වල පත්‍ර හෝ මුල් කපා දැමීමක් සිදු නොකරනු ලබනුයේ මුල් මඟින් ජල අවශෝෂණය සිදු කරනු ලබන බැවිනි. මෙලෙස පැය 48 ක් ජලයේ ගිල්වීම මඟින් කෝමය තුළ වැඩි ජල සාන්ද්‍රණය හේතුවෙන් ගුල්ලාගේ බිත්තර, කීට අවස්ථා සහ සුහුඹුල් ගුල්ලා සම්පූර්ණයෙන් විනාශ වේ. මෙලෙස ප්‍රතිකාර කළ පැළ කාබෝෆියුරාන් රසායනික ප්‍රතිකාරය නොමැතිව කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවිය හැකිය.

ii. තාප ප්‍රතිකාරය

පැළ ලබා ගැනීමට යෝජිත මව් ගාකයට මෙම ප්‍රතිකාරය කරනු ලැබේ. මෙහිදී මව් ගාකය පොළොව මට්ටමින් කපා දමා එයට උඩින් කොළ රොඩු දමා හොඳින් ගිනි තැබීම සිදු කරනු ලබයි. මෙලෙස ගිනි තබා දින 2 කට පසු වර්ෂාව නොමැති නම් ජල සම්පාදනය කළ යුතුවේ. මෙම ක්‍රමයෙන් ගුල්ලාට අමතරව වල් පැළෑටි මෙන්ම වල් බීජ ද විනාශ වේ. පසට පොටෑසියම් එකතුවීම ද අමතර වාසියකි. වර්ෂාව හෝ ජල සම්පාදනය සමඟ පොටෑසියම් පස තුලට යාමෙන් මොරෙයියන් වර්ධනයට උපකාරී වේ. මාස 2 - 2 1/2 ක කාලසීමාවක කෙසෙල් ගුල්ලාගෙන් තොර නිරෝගී රෝපණ ද්‍රව්‍ය සිටුවීම සඳහා ලබාගත හැකිය.

මෙම ආකාර දෙකටම වාණිජ මෙන්ම වාණිජ නොවන වගාවන් සඳහා පහසුවෙන් කෙසෙල් ගුල්ලාගෙන් තොර රෝපණ ද්‍රව්‍ය ලබාගත හැකිවේ.

*මූලාශ්‍රය: ආචාර්ය සුජාතා වීරසිංහ, ප්‍රධානි, උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය මාතර.*

# පුලස්ති - බහු කාර්ය කෙසෙල් ප්‍රභේදයක්

INIBAP සහයෝගිතා වැඩ සටහන යටතේ බෙල්ජියම් ජාත්‍යන්තර මියුසා සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය විසින් හඳුන්වා දුන් චතුර්ගුණ දෙමුහුම් කෙසෙල් ප්‍රභේදයකි. මෙහි ජාන සංයුතිය AABB වේ.

මෙම ප්‍රභේදය 2002 වසරේ සිට ලංකාවේ සියළුම කෙසෙල් වගා ප්‍රදේශවල හොඳින් වගා කළ හැකි ප්‍රභේදයක් ලෙස උසස් උපයෝගිතාවයක් පෙන්වන ලදි. උසස් පාලන තත්ත්ව යටතේ කි.ග්‍රෑම්. 25 ක් බර කැන් ලබා දෙන ලදි. මෙම ප්‍රභේදය ජල හිඟ තත්ත්ව වලට ප්‍රතිරෝධී, අර්ධ කුරු ප්‍රභේදයක් වන අතර, සුළං සහිත ප්‍රදේශ වලටද උචිත වේ. ශක්තිමත්, කෙටි ව්‍යාජ කඳ සහිත මෙම ප්‍රභේදය ආන්තික ඉඩම් වල ද හොඳින් වගා කළ හැකිය. එමෙන්ම කළු සිගටෝකා රෝගය ප්‍රතිරෝධී ප්‍රභේදයක් ලෙස ද සලකනු ලබයි.

මෙම ප්‍රභේදයේ පැසුණු ගෙඩි, ජනප්‍රිය ප්‍රභේදයක් වන අළු කෙසෙල් වලට ආදේශකයක් ලෙස හඳුන්වයි. එමෙන්ම ජ්‍රෙස්ට් නිෂ්පාදන (කෙටි කෑම) සඳහා අර්තාපල් වෙනුවට භාවිතා කළ හැකිය. එයට අමතරව බැද ගත් පෙති වලට මිරිස් හෝ ලුනු හෝ සීනි එක්කර රසවත් ස්නැක්ස් ආහාරයක් ලෙස සකස් කර ගත හැකිය. නොඉදුනු කෙසෙල් ගෙඩි කිලෝ ග්‍රෑම් 01 කින් බැදගත් පෙති ග්‍රෑම් 300 ක පිළියෙල කරගත හැකි අතර, එය පිළියෙල කිරීමට රුපියල් 40 ක් වැයවේ (කම්කරු ශ්‍රමයද ඇතුලත්ය).

මෙම නිෂ්පාදනයට බැදගත් රටකජු, සෝයා බෝංචි, සූරියකාන්ත ඇට, ග්‍රීන්පීස්, කජු වැනි ද, එක් කිරීමෙන් වඩාත් රසවත් කරගත හැකිය. මෙය දැනට වෙළඳ පොලේ ඇති කෘත්‍රිම රසකාරක සහිත ආහාර වෙනුවට හඳුන්වා දිය හැකි එමෙන්ම සුළු පරිමාණ ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙස මෙන්ම වාණිජ මට්ටමේ කර්මාන්තයක් ලෙස ද විභවයන් සහිත නිෂ්පාදනයකි. පුලස්ති ප්‍රභේදයෙන් නිපදවන මෙම ආහාරයේ තත්ත්වය දැනට ශ්‍රී ලංකාවේ ඇති මේ සඳහා යොදා ගත හැකි අනෙකුත් ප්‍රභේද වලින් කරන නිෂ්පාදන වලට වඩා බෙහෙවින් උසස් වේ.

මෙයට අමතරව තම්බාගත් ගෙඩි පෝෂ්‍යදායී උදෑසන ආහාරයක් ලෙස ද හැඳින්විය හැක. නොඉඳුනු කොළ පැහැති ගෙඩි තැම්බීම, වාෂ්පයෙන් තැම්බීම හෝ පොතු සහිතව උදුනක පිළිස්සීම කළ හැකිය. මධ්‍ය මෘදු බවට පත්වූ පසු කෙසෙල් ලෙල්ල පහසුවෙන් ගලවා ඉවත් කළ හැකිය. මෙම කෙසෙල් ගෙඩි තිරු ලෙස කපා ලුනු, ගම්මිරිස්, ස්වල්පයක් එක්කර ගාගත් පොල් සමඟ පිළිගැන්විය හැකිය.

උඳුනේ පිළිස්සූ කෙසෙල් තිරු, ගාගත් පොල් හා චිලි ජේස්ට් හෝ කට්ට සම්බල් සමඟ පෝෂ්‍යදායී රසවත් උදෑසන ආහාරයක් ලෙස භාවිතා කළ හැකිය.

*මූලාශ්‍රය: ආචාර්ය සුජාතා වීරසිංහ ප්‍රධානි, උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය, මාතර.*

# කොහොඹ මද පල්පය- ආහාර අහේනි කාළයට මීමැසි කර්මාන්තය සඳහා භාවිතා කළ හැකි ආහාර ප්‍රභවයක්

ඉන්දියාවේ කොහොඹ ශාක මිලියන 14 ක් පමණ ඇති අතර, සෑම ගසකින්ම වසරකට කොහොඹ ගෙඩි කි.ග්‍රෑම්. 50 ක පමණ අස්වැන්නක් ලබාදේ. එක් කොහොඹ ගසකින් කොහොඹ මද පල්පය කි.ග්‍රෑම්. 20 ක් වසරකට ලබා දෙන අතර, මෙය ප්‍රයෝජනයට නොගන්නා බැවින්, විනාශ වී යයි. අලුත් මද පල්පයෙහි තෙතමනය 40-50%, කාබෝහයිට්‍රේට් 6.5%, ප්‍රෝටීන 0.65%, ඇස්කෝබික් අම්ලය 0.024%, අළු 8.3%, විටමින සහ ඇමයිනෝ අම්ල අඩංගු වේ.

මීමැසි පාලනය ඉන්දියාවේ ග්‍රාමීය ජනතාවට වඩාත් යෝග්‍ය කෘෂි ව්‍යපාරයක් වේ. බෝග වගාවන්වල පරාගනය වැඩි කිරීම මගින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට උපකාරීවීම සහ මීපැණි නිෂ්පාදනය යන ක්‍රියාදම තුළින් පවුලේ ආදයම වැඩිකිරීම හා රැකියා ජනනය මෙමඟින් සිදුවේ. එහෙත් මීමැසි පාලනයේදී ඇතිවන ප්‍රධාන ගැටළුවක් නම් ජුනි, ජුලි මාසවල ඇතිවන මල් හා පරාග අහේනි කාලය තුළ මීමැසි ජනාවාස නඩත්තු කිරීමයි. යෝග්‍ය සහ ප්‍රමාණවත් ආහාර ප්‍රභවයන් තිබීම මීමැසි ජනාවාස වල පැවැත්ම සඳහා ඉතා වැදගත් වේ. ආහාර අහේනිය නිසා දුර්වල වූ ජනාවාස කලහකාරී තත්ත්වයට පත්වීම හෝ පලායාම සිදුවේ.

ඉන්දියානු විද්‍යාඥයින් (Unirevsity of Agriculture & technologe, Kumargni, India) පිරිසක් විසින් පරාග සහ මල් පැණි මෙන්ම ආහාර ප්‍රභවයක් ලෙස කොහොඹ බීජයේ පල්පය භාවිතා කිරීම පිළිබඳව පරීක්ෂණ පැවැත්වුණි. කොහොඹ ගෙඩිවල බීජය අතින් ඉවත් කර ලබාගත් පල්පය මීමැස්සන්ට (Apis mellifera) ආහාර ලෙස සැපයීම කරන ලදී. ඔවුන්ගේ නිරීක්ෂණ අනුව ආහාර අහේනි කාලය තුළදී (කොහොඹ මද පල්පය සහ සිරප්) මීමැසි ජනාවාස විසින් හොඳින් උපයෝගී කරගත් බව පෙනුණි. එමඟින් මී මැසි ජනාවාසයේ ශක්තිමත් බව, වර්ධනය සහ සංවර්ධනය සැලකිය යුතු මට්ටමින් වැඩි දියුණු විය. කොහොඹ මද පල්පය හා සිරප් භාවිතා කළ ජනාවාසවල මීපැණි නිෂ්පාදනයේ සාමාන්‍ය සහ ජනාවාසයේ ගහනය වැඩිවීම සීනි සිරප් භාවිතා කළ ජනාවාස වලට වඩා දෙගුණයකට වඩා වැඩි විය. එමෙන්ම බිත්තර දමන ප්‍රදේශය, රැජිනගේ බිත්තර දැමීමේ කාර්යක්ෂමතාව, ජනාවාසයේ ශක්තිමත්බව, මීපැණි නිෂ්පාදනය සහ ගහණය වැඩිවීම යන කරුණු වැඩි දියුණු කිරීමට එය හේතු විය.

මේ නිසා කොහොඹ මද පල්පය, වටිනා මීමැසි ආහාරයක් බවට පත් කිරීම ඉන්දියන් මීමැසි කර්මාන්තයේ වැඩි දියුණුව සඳහා වැදගත් තාක්ෂණයක් ලෙස හඳුන්වා ඇත.

*මූලාශ්‍රය:* ***SAIC Newsletter, vol. 14 No. 2, April - June 2004***
***www.Saic-dhaka.org***

# පුළුල් තොරතුරු කළමණාකරනය සහ ක්ෂේත්‍ර භාවිතය තුළින් භෝග වනගත දර්ශ ස්ථානීය සංරක්ෂණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ භෝග ප්‍රභේද වැඩි දියුණු කිරීම සඳහා අප රටේ ඇති භෝග වල වනගත දර්ශ (Crop Wild Relatives) තවමත් නිසියාකාරව භාවිතාකර නොමැත. ලංකාවේ සමහර භෝග වනගත දර්ශ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථාන ජාන බැංකුවේ සංරක්ෂණය (පරිබාහිර සංරක්ෂණය) කර ඇති නමුදු, බොහොමයක් වනගත දර්ශ ලංකාවේ අනෙකුත් ජෛව විවිධත්වය මෙන්ම, මිනිසා කේන්ද්‍රකොට වූ ක්‍රියාකාරකම් නිසා වඳවීයාමේ තර්ජනයට මුහුණපා ඇත. මෙම වටිනා ජෛව සම්පත් සංරක්ෂණය කර ගැනීම සඳහා, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය සමග එක්ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. එක්සත් ජාතීන්ගේ පරිසර ව්‍යාපෘතිය (UNEP) හා ගෝලීය පරිසර පහසුකම් සැපයීමේ ආයතනය (GEF) මඟින් මූල්‍යමය පහසුකම් සපයන මෙම ව්‍යාපෘතිය අන්තර්ජාතික පැළෑටි ජාන සම්පත් ආයතනය මගින් ලොවපුරා ක්‍රියාත්මක කරයි. ශ්‍රී ලංකාවට අමතරව ආමේනියා, බොලිවියා, මැඩගස්කර් හා උස්බෙකිස්ථාන් යන රටවල ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

බෝග වනගත දර්ශ ස්ථානීය සංරක්ෂණය සහ ඒවා භාවිතය වැඩි දියුණු කිරීම සඳහා මෙම රටවල ඇති දත්ත හා තොරතුරු යොදාගැනීමට රටවලට ඇති සත්‍යතාව වැඩි දියුණු කිරීම සහ අන්තර් ජාතික තොරතුරු පද්ධතියක් සමග සම්බන්ධ විය හැකි බෝග වනගත දර්ශ පිළිබඳව ජාතික තොරතුරු කළමණාකරන පද්ධතියක් ගොඩ නැංවීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ.

ශ්‍රී ලංකාවේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේලා වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, බණ්ඩාරණායක ආයුර්වේද පර්යේෂණ ආයතනය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, විශ්ව විද්‍යාල හා ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය වැනි ආයතන රාශියක් දායක වේ.

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් තුළින් එයට සම්බන්ධවන ආයතනයන්හි නිලධාරීන් සඳහා තොරතුරු කළමණාකරනය, ශාක ස්ථානීය සංරක්ෂණය හා භාවිතය, ශාක පිළිබඳ භූගෝලීය පරිසර (eco geograpic) සමීක්ෂණ පැවැත්වීම පිළිබඳ පුහුණු ලබාදීම සිදුකිරීම මෙන්ම බෝග වනගත දර්ශ හඳුනා ගැනීම හා සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීමට සැලසුම් සකසා ඇත.

ව්‍යාපෘතියට දායකවන ආයතන අතර සම්බන්ධීකරණය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මගින් කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය අවුරුදු පහක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වීමට නියමිතය.

*මූලාශ්‍රය: ආචාර්ය අනුර විජේසේකර ජාතික ව්‍යාපෘති සමායෝජක, භෝග වනගත දර්ශ ව්‍යාපෘතිය.*

## දේශීයව නිෂ්පාදනය කළ එප්පාවල සිංගල් සුපර් පොස්පේට් (Single Super phosphate) හඳුන්වා දීමේ වැඩ සටහන

එප්පාවල පොස්පේට් නිධිය අප රටට වටිනා සම්පතක් වුවත් මේ රටේ භාවිතා කරන පොස්පේට් පොහොර වලින් විශාල ප්‍රමාණයක් තවමත් පිටරටින් ආනයනය කරයි. මෙම නිධියෙන් නිපදවන රොක් පොස්පේට් එහි දුර්වල ජල ද්‍රාව්‍යතාව හේතුවෙන් ප්‍රධාන වශයෙන්ම තේ සහ වෙනත් බහු වාර්ෂික බෝග සඳහා පමණක් භාවිතා වේ. වී හා අතිරේක ආහාර බෝග වැනි කෙටිකාලීන බෝග වල පොස්පරස් පෝෂක අවශ්‍යතාව සපුරාලීම සඳහා සම්පූර්ණයෙන් භාවිතා වනුයේ ආනයනය කළ ත්‍රිත්ව සුපර් පොස්පේට් වේ. එබැවින් එප්පාවල පොස්පේට් නිධියෙන් වැඩි දායකත්වයක් දේශයේ කෘෂි කර්මාන්තයට ලබාදීම අරමුණු කොටගෙන වී, අතිරේක බෝග සහ එළවළු වැනි කෙටිකාලීන බෝග සඳහා භාවිතා කළ හැකි ආකාරයේ පොහොර වර්ගයක් නිෂ්පාදනය කිරීමට ලංකා පොස්පේට් ලිමිටඩ් (රාජ්‍ය සමාගම) විසින් ආරම්භ කර ඇත. සිංගල් සුපර් පොස්පේට් ලෙස හඳුන්වන මෙම පොහොර වල පොටෑසියම් පොස්පේට් ($P_2O_5$) 17.1% ක් අඩංගු වේ. වී වගාව සඳහා මෙම සිංගල් සුපර් පොස්පේට් (ESP) භාවිතය පිළිබඳව පර්යේෂණ සිදු කෙරෙමින් පවතින අතරම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පොස්පේට් සමාගම ඒකාබද්ධව ක්ෂේත්‍ර අත්හදා බැලීම් 100 ක් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමේ කටයුතු 2004 වසරේදී ආරම්භ කරන ලදී.

මෙහිදී දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වී වගාවේදී නිර්දේශිත සාන්ද්‍ර සුපර් පොස්පේට් පොහොර හා එප්පාවල සුපර් පොස්පේට් භාවිතයෙන් ලැබෙන අස්වැන්න සැසඳීමෙන් ප්‍රතිඵල විශ්ලේෂණය කරනු ලැබේ. 2004-2005 මහ කන්නයේ ප්‍රතිඵල අනුව එප්පාවල සිංගල් සුපර් පොස්පේට් භාවිතයෙන් ද අස්වැන්නේ වෙනසක් දක්නට නොලැබුණ අතර, සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇති බව ද, අනාවරණය විය. එහෙත් එප්පාවල සුපර් පොස්පේට් භාවිතය පිළිබඳව නිර්දේශයන් ලබාදීම සඳහා තවත් කන්න කිහිපයක ප්‍රතිඵල විග්‍රහ කළයුතුය.

එමෙන්ම වී වගාවට අමතරව අතිරේක ආහාර බෝග හා එළවළු සඳහා ද මෙම පර්යේෂණ අත්හදා බැලීම් පුළුල් කිරීමටද තීරණය කර ඇත.

**සංස්කරණය**
**ජයන්තා ඉලන්කෝන්**

## සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයෙන් පණිවිඩයක්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන පහත සඳහන් ග්‍රන්ථ දැන් ඔබට මිලදී ගත හැකිය.

- **2004 යල Cost of Cultivation**

  ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කෘෂි බෝග වර්ග වන වී, බඩඉරිඟු, ළූණු, අල වර්ග, උඩරට හා පහතරට එළවළු වර්ග වල නිෂ්පාදන වියදම් හා ආදායම් පිළිබඳ දත්ත විශ්ලේෂණය. පොතක මිල රු. 250/=

- **AgStat 2005**

  විවිධ ආයතනය මඟින් පල කරනු ලබන කෘෂිකාර්මික දත්ත වගාබිම් වපසරිය, ආනයන අපනයනය දත්ත විවිධ බෝග වල තොග හා සිල්ලර මිල ආදී දත්ත ඇතුලත් සාර සංග්‍රහය. පොතක මිල රු. 50/=

**මිළදී ගත හැකි ස්ථාන**

- සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය
  තැ.පෙ. 07, පේරාදෙණිය.
  දුරකථනය අංකය : 081 - 2388206 / 2388081
  ෆැක්ස් අංකය : 081 - 2388206

- කෘෂි ප්‍රකාශන මධ්‍යස්ථානය,
  තැ.පෙ. 31, පේරාදෙණිය.
  දුරකථන අංකය : 081 - 2388123

http://www.agridept.gov.lk මඟින් වැඩි විස්තර ලබාගත හැකිය.

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

මුද්‍රිත ද්‍රව්‍යය
භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.